# ලකුණු දීමේ පටිපාටිය

## දෙවන වාර පරීක්ෂණය - 2019

## ඉස්ලාම් - 11 ශ්‍රේණිය

### කොටස-i

| | | | |
|---|---|---|---|
| 1 - 3 | 11 - 4 | 21 - 3 | 31 - 3 |
| 2 - 2 | 12 - 3 | 22 - 2 | 32 - 1 |
| 3 - 2 | 13 - 2 | 23 - 4 | 33 - 4 |
| 4 - 2 | 14 - 4 | 24 - 3 | 34 - 1 |
| 5 - 3 | 15 - 3 | 25 - 3 | 35 - 2 |
| 6 - 3 | 16 - 1 | 26 - 3 | 36 - 3 |
| 7 - 3 | 17 - 1 | 27 - 3 | 37 - 4 |
| 8 - 4 | 18 - 4 | 28 - 1 | 38 - 1 |
| 9 - 2 | 19 - 3 | 29 - 3 | 39 - 1 |
| 10 - 2 | 20 - 3 | 30 - 1 | 40 - 1 |

(ලකුණු 1 x 40 = 40)

### කොටස - ii

**(01)** 1. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා ද එතුමාගේ මිත්‍රවරුන් ද ජීවත් වූ ක්‍රමය අනුගමනය කිරීම වේ.

2. මෙය දේවවාදයක් හෝ කිසි දු ආගමික විශ්වාසයක් හෝ නොමැති තත්ත්වයයි.

දේව වාදය ප්‍රතික්ෂේප කර ආගම් , දේව මගපෙන්වීම් හා දේව දූතයන් ප්‍රතික්ෂේප කිරීම ඔවුන්ගේ ප්‍රධාන ඉලක්කයයි.

3. i. අස්වතුල් අන්සි ii. මුසයිලමා

4. i. නියියත් තැබීම ii. සුදුස්සන් වෙත බෙදා දීම

5. කිලාෆත්

6. i. වලීද් ඉබ්නු මුකීරා ii. ලෆීත්

7. වහී මත්ලුව් -අල්කුර්ආන් , වහී ගෛරු මත්ලුව්- අස්සුන්නාහ් අල්හදීස්

8. i. ෆර්ල් වූ පස්වේල් සලාතය ii. දෙමාපියන්ට අවනතවී හැසිරීම

iii. පවුල පරිපාලනය කිරීම iv. රමළාන් මාසයේ උපවාසය යෙදීම (ඕනෑම පිළිතුරු දෙකක්)

9. i. සලාහුද්දීන් අයියූබි ii. මහ්මූද් අල්කුදුස්

10. i. නිකාහ් සහීහ් ii. නිකාහ් මුත්ආ

(ලකුණු 20යි)

**02)** 1. ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල් /ඉමාම් අබුල් හසන් අල් අෂ්අරි/ ඉමාම් අබූමන්සූර් අල්මාතුරූදී/ ඉමාම් අබූ ජහ්ෆර් අත්තහාවි

2. i.ප්‍රමාණවත් ආදායම් මාර්ගයක් ඇති අය.

ii. වහල්ලු iii. බනූ හාෂිම් , බනූ මුත්තලිෆ් පවුලේ අය iv. සකාත් ලබා දෙන්නාගෙ යෙපෙන්නන්

vi. මුස්ලිම් නොවන අය (ඕනෑම කරුණු 3ක් )

3. ● එතුමා පිළිබඳ එක් වචනයක්වත් හෝ දන්නේ නම් ඒ පිළිබඳ අන් අයට දන්වන ලෙස දැන්වීම

● තමා නොපැවසූ දේ පැවසූ ලෙසට ව්‍යාජ දේ ඉදිරිපත් කරන්නන්, නිරය තම වාසස්ථානය කර ගන්නා බවට අවවාද කළෝය.

● හදීස් නිවැරදි ව වනපොත් කිරීමෙහි ද සටහන් කර ගැනීමෙහි ද ලා දැඩි උනන්දුවක් දැක්වූහ.

● හදීස් ඉගෙනුමට හා ඉගැන්වීමට සමහර සහාබාවරුන්ව පත් කළහ.

● අස්හාබුස්සුෆ්ෆා වරුන් ද නබි සල් තුමා මේ සඳහා යොදා ගත්හ. (කරුණු පහක් ලියා ඇති විට එකකට ලකුණු 1 බැගින් මුළු ලකුණු පහක් ලබා දෙන්න)

(ලකුණු 10යි)

03) 1. දේව දූතයන්වරුන් යනු අල්ලාහ්ගේ මගපෙන්වීම ලොවට හඳුන්වාදීමේ මෙහෙය ඉටුකළ අය වේ. ඔවුහු අල්ලාහ් තආලාගෙන් ලැබුණු මගපෙන්වීම හා දේශනා ගැත්තන්ට පැනවීමත් වැළැක්වීමත් රිසාලත් නම් වේ.

2. මගේ ගැත්තනගෙන් බොරු කාරයන් 30දෙනෙක් බිහිවේ, ඔවුන් සියලු දෙනා තමන් නබිවරයෙක් යැයි වාද කරයි. නමුත් මම අවසන් නබි වෙමි. මගෙන් පසු කිසිම නබිවරයෙක් නැත.(අබූදාවුද්)

පෙළ පොතේ සඳහන් මෙවැනි ඕනෑම හදීසයක් සඳහා ලකුණු ලබා දෙන්න

3. i. සංසර්ගයෙහි යෙදීම ii. ශුක්‍රාණු පිටවීම iii. අලුතින් ඉස්ලාමය වැළඳගැනීම iv. හයිල්, නිෆාස් පිටවීම

පිරිසිදු කරන ආකාරයː- ෆර්ලු වූ නෑම ඉටුකරමි යනුවෙන් නීයියත් තබා මුළු ශරීරයේ කොටස් ජලයෙන් තෙමා ගත යුතුයි (මහ කිල්ල ලියා ඇතිවිට ලකුණු තුනක් ද පිරිසිදු කරන අයුරු ලියා ඇති විට ලකුණු 2ක් ද ලබා දෙන්න

(ලකුණු 10යි)

04) 1. අල්ලාහ් කෙරෙහි ආදරය දැක්වීම / අල්ලාහ්ගේ මැවීම් කෙරෙහි ආදරය දැක්වීම

2. ● දෙමුහුද එකිනෙක හමුවීමේ දී ඒ දෙක අතර බාධකයකි. මෙය දැනුම් සම්භාරයෙන් ද ප්‍රතිහාර්යයකි

● කලල වර්ධනය පිළිබඳ අල්කුර්ආනයේ සඳහන් අදහස් දැනුම් සම්භාරයෙන් ද ප්‍රතිහාර්යයකි

● මී පැණිවල ඖෂධීය ගුණයක් ඇති බව අල් කුර්ආනයේ 16 අන්නහල් : වැකියෙන් පෙන්වා දී තිබේ.

● මහපොළොවේ සිට ඉහළට යනවිට ඔක්සිජන් වායුව අඩු වේ. අදහස් දැනුම් සම්භාරයෙන් ද ප්‍රතිහාර්යයකි

● ෆිර්අවුන් ජලයේ ගිල්වන අතර ඔහුගේ ශරීරය ආරක්ෂා කරන ලෙස ද සඳහන් කර ඇත.

(ඕනෑම කරුණු 3ක් සඳහා ලකුණු 3ක් ලබා දෙන්න)

3. ● නියියත් තැබීම (ඉහ්රාම් ඇඳීම)

● තවාෆුල් ඉෆාලා ඉටු කිරීම.

● හිස කෙස් ඉවත් කිරීම

● දුල් හජ් 9 වන දින අරෆාහි රැඳීම.

● සඊ ඉටු කිරීම.

● අනුපිළිවෙළට ඉටු කිරීම.

(ලකුණු 10යි)

05) 1. මස්ජිදුල් හරාම්/ මස්ජිදුල් නබවි/ මස්ජිදුල් අක්සා

2. ● අල්ලාහ් වෙතය යන පිරිසිදු චේතනාවෙන් තව්බා කිරීම

● තමා කළ පාපයන් අතහැර එයින් සහමුලින් ම ඉවත් වීම

● පෙර කළ ඒ පාපය නැවතත් නොකරමි" යනුවෙන් ප්‍රතිඥා දීම

● කරන ලද පාපය මිනිසා හා සම්බන්ධ වන්නේ නම් ඔහුගෙන් සමාව ඉල්ලා පසු ව අල්ලාහ්ගෙන් සමාව අයැදීම

(මින් ඕනෑම කරුණු 3ක් ලියා ඇති විට ලකුණු 3ක් පිරිනමන්න)

3. සහීහ් බුහාරි - මුහම්මද්

සහීහ් මුස්ලිම් - මුස්ලිම්

ජාමිඋත් තිර්මිදි - මුහම්මද්

සුනන් අබූ දවූද් - සුලෙයිමාන්

සුනන් නසාඊ - අහ්මද්

සුනන් ඉබ්නුමාජාහ් - මුහම්මද්

(ඕනෑම හදීස් ග්‍රන්ථයන් 5ක් සමග ඔවුන්ගේ නම් ලියා ඇති විට ලකුණු එක බැගින් ලකුණු 5ක් දෙන්න)

(2+3+5 = ලකුණු 10යි)

06) 1. අලුත් ගැටලුවක් මතු වී එයට විසඳුම් අල් කුර්ආනය හෝ සුන්නාව මගින් සෘජු ව ලබා දී නොමැති වූ කල අල් කුර්ආනය හා සුන්නාව පිළිබඳ ගැඹුරු දැනුමක් ඇති උගතුන් ඒ මූලාශ්‍රය දෙක මූලික කොට ගනිමින් කරුණු සොයා ගැනීම නැතහොත් උත්සාහය ඉජ්තිහාද් වේ.

2. තක්වා හා මනා හැසිරීම් වලින් පිරුණු කෙනෙක් වීම/ අරාබි භාෂාවේ නිපුණයෙකු වීම / අල් කුර්ආන් හා සුන්නා පිළිබඳව ගැඹුරු දැනුමක් තිබීම/ ඒ දෙක හා සම්බන්ධ වූ සෙසු කලාවන්හි නිපුණයන් වීම/ඔවුන්ට පෙර සිටි මුජ්තහිද්වරුන්ගේ ඉජ්තිහාද් පිළිබඳ පැහැදීමක් ඇත්තෙකු වීම / සොයා ගැනීම සඳහා මතු වූ ගැටලුව පිළිබඳ පැහැදීමක් ඇත්තෙකු වීම (නිවැරදි පිළිතුරු දෙකක් සඳහා එක ලකුණු බැගින් ලකුණු 3ක් ලබා දෙන්න)

3. ● අල්කුර්ආනය පාරායනය කිරීම ස්ථාපිත කිරීම (ජාමිඋල් කුර්ආන් යන විශේෂ විරුදාවලිය ලැබීය)

● ප්‍රථම වතාවට නාවික හමුදාව ස්ථාපිත කිරීම

● පාලන ව්‍යාප්තිය ඇති කිරීම (ඇලෙක්සැන්ඩ්‍රියාව සිට උතුරු අප්‍රිකාව දක්වා රටවල්)

● හිජ්රි වර්ෂ26දී මස්ජිදුල් හරාම් විශාල කිරීම

● බයිතුල්මාල්හි සේවය ව්‍යාප්ත කිරීම

● ඇලමාර්ග, මහා මාර්ග ඉදිකිරීම, පොදු ළිං කැණීම් ආදී මූලික අවශ්‍යතා සඳහා මැදිහත් වීම

(2+3+5 = ලකුණු 10යි)

06) 1. ● නබි සල් තුමාණන්ගේ වයස අවුරුදු 40දී හිරා ගුහාවේදී අල්කුර්ආනය පහල විය

● ලෛලතුල් කද්ර් රාත්‍රියේ දී ප්‍රථම වහී පහල වීම

● නබි සල් තුමාණන් හිරා ගුහාවේ තනියම රැඳී සිටි අවස්ථාවේ ජිබ්රීල් (අලෛ)තුමා පැමිණ ඉක්රඃ(කියවන්න) යැයි පැවසීය. එවිට එතුමාණෝ මම කියවන්නට නොදනිමි යැයි පැවසූහ

●.එවිට ජිබ්රීල් (අලෛ) තුමා මුහම්මද් නබි (සල්) තුමාණන් ව තදින් වැළඳ නැවත වරක් කියවන්න යනුවෙන් කීවේය. එවිට ද පෙර සේ කියවන්නට නොදනිමි යැයි කීවේ ය. මෙසේ තෙවරක් සිදු විය.

● ඉන් පසු සූරා අලක් හි ප්‍රථම වාක්‍ය පහ පාරායනය කර පෙන්වූහ. එවිට නබි සල් තුමාද පාරායනය කළේය.

● එතුමාණන් හට තැතිගැන්මක් හා බියක් ඇති විය. නිවස කරා ගොස් "මාව පොරවන්න, මාව පොරවන්න" යැයි පැවසූහ. බිරිඳ වන කදීජා (රළි) තුමිය වෙත පැවසුවාය.

● සිදු වූ දේ විමසා කදීජා (රළි)තුමිය නබි මුහම්මද්(සල්) තුමාණන්ව තම නෑයෙකු වූ වරකා බින් නව්ෆර් වෙත එක්කර ගෙන ගිහින් ධෛර්යවත් කළාය.

(මෙවැනි කරුණු පහක් ලියා ඇති විට ලකුණු 5ක් ලබා දෙන්න)

2. **<u>ජාතික යහපත කෙරෙහි මුස්ලිම්වරුන්ගේ දායකත්වය</u>**

- ලංකාවේ මැණික්, ඇත් දළ, සුවඳ විලවුන් යනාදිය විදේශ රටවලට ගෙන ගියහ. මෙම මගින් විදේශ විනිමය උපයා ගත්හ.
- ගොවිතැන් නගා සිටුවීමට කටයුතු කළහ
- පේෂ කර්මාන්ත වර්ධනයට වෙහෙස වූහ
- තවලම් ප්‍රවාහන ක්‍රමය හඳුන්වා දීම
- සිංහල රජවරුන් සමග එකතු වී රටේ සංවර්ධනය සඳහා කැප වීම
- ශ්‍රී ලංකාවේ නිදහස වෙනුවෙන් අනෙකුත් ජාතීන් සමඟ එක් ව ඉංග්‍රීසීන්ට විරුද්ධව සටන් කළහ.

3. **<u>''අස් සබ්ර්'' (ඉවසීම)</u>**

- මිනිස් ජීවිතයේ වැදගත් ගුණාංගයකි. ● සෑම මුස්ලිම්වරයකුගේ ම දෙලොව ජීවිතයේ ජයග්‍රහණයට එය පාදක වේ. ● තව ද ඉවසීමෙන් හා සලාතය (ඉටු කිරීම) මඟින් පිහිට පතනු..." (2 අල් බකරා :45)
- "අල්ලාහ් තමා යහපත් දේ ලබා දීමට කැමතිවන්නන් හට ඔවුන්ගේ ඉවසීම පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂාවට ලක් කරයි" (බුහාරි)
- ඉවසීමට කුලිය වශයෙන් ස්වර්ගය ලබා දෙයි.

(මෙවැනි ඕනෑම කරුණු 5ක් සඳහා ලකුණු 5ක් ලබා දෙන්න)

4. **<u>ඉමාම් ෂාෆි රහිමහුල්ලාහ්</u>**

- මෙතුමා පලස්තීනයේ ගාසාහි හිජ්රී වර්ෂ 150හි දීඋපත ලැබුවේ ය.
- "ආලිමුල් කුරෙෂ්" යන අන්‍ය නාමයකින් ද හඳුන්වනු ලැබූහ.
- මක්කාවේ හා මදීනාවේ අධ්‍යාපනය ලද එතුමාණෝ ඉස්ලාමීය අධිරාජ්‍යයේ අගනුවර වු බැග්ඩෑඩ්හි ඉගැන්වීම් කටයුතුවල යෙදුණහ.
- ඉමාම් ෂාෆිඊ රහ්මහුල්ලාහ් සම කාලීන අරාබි සාහිත්‍ය, වෛද්‍ය විද්‍යාව වැනි ක්ෂේත්‍රවල ද ප්‍රවීණයෙක් වූයේ ය.
- තව ද ඔහු කවියෙකු ලෙස ද ප්‍රසිද්ධ ය. මුස්නද් ඉමාම් ෂාෆිඊ, කිතාබ් අල් උම්මු, අර්රිසාලතුල් උසූලියියා ආදිය එතුමාගේ ග්‍රන්ථ වශයෙන් සුප්‍රසිද්ධ ය.
- සුල්තාන් සලාහුදීන් කාලයේ ඊජිප්තුවේ රාජ්‍ය මද්හබය ලෙස ප්‍රකාශයට පත් විය.

(මෙවැනි ඕනෑම කරුණු 5ක් ලියා ඇති විට උපරිම ලකුණු 5යි)